**පරිසර අමාත්‍යාංශය**

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ
දෙපාර්තමේන්තුවේ
කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2
සේවා ගණයේ III ශ්‍රේණියේ වෙරළ සංරක්ෂණ නියාමක
තනතුර සඳහා සීමිත පදනම මත බඳවා ගැනීම - 2026

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ, දෙපාර්තමේන්තුගත කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා ගණයේ III ශ්‍රේණියේ වෙරළ සංරක්ෂණ නියාමක තනතුරු 09 ක් සඳහා සීමිත පදනම මත බඳවා ගැනීම සඳහා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ පහත සුදුසුකම් සතුව ඇති ස්ත්‍රී / පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

**02. සපුරාලිය යුතු සුදුසුකම් :**

**(I) අධ්‍යාපන සුදුසුකම් :**

අධ්‍යයන පොදු සහතික පත්‍ර ( සාමාන්‍ය පෙළ) විභාගයේ සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය යන විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින්(06) සමත්ව තිබීම.

**(II) පළපුරුද්ද :**

ඉහත අධ්‍යාපන සුදුසුකම් සහිතව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය නොවන හෝ අර්ධ ශිල්පීය තනතුරක නියමිත දිනයට පූර්වාසන්නව අවුරුදු 05 ක ස්ථිර හා සක්‍රිය සේවා කාලයක් සපුරා තිබිය යුතුය. අදාළ තනතුරේ පත්වීමෙහි ස්ථිර කර තිබිය යුතුය.

*සටහන*

යම් තනතුරකට ස්ථිරව පත්කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තා වූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තා වූ පුහුණු වීමේ කාලපරිච්ඡේදයක් ඉහත සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාලසීමාව සඳහා ගණන්ගනු නොලැබේ. එසේම යම් තනතුරකට ස්ථිර වශයෙන් පත්කරනු ලැබීමට පෙර සේවය කර ඇති

තාවකාලික/ අනියම් සේවා කාල පරිච්ඡේද ද ඉහත සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන්ගනු නොලැබේ.

**(III) වෘත්තීය සුදුසුකම් :** අදාළ නොවේ.

**(IV) කායික සුදුසුකම් :**

සෑම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටුකිරීමට හැකි වන පරිදි මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.

**(V) වෙනත් :**

(අ) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(ආ) පූර්වාසන්න වසර පහ තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම, වැටුප් වර්ධක උපයාගෙන තිබීම හා සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

(ඇ) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**(VI) වයස :** අදාළ නොවේ.

**03. වැටුප් පරිමාණය :-**

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව, මාසික වැටුප් පරිමාණය :

රු.45,230 - 10x540 - 11x630 - 10x890 – 10x1190 - රු.78,360/- ( MN 1 – 2025 ) වේ.

**04. සේවයේ අනුයුක්ත කරවීමේ පොදු නියමනයන් හා සේවා කොන්දේසි :**

(අ) වෙරළ සංරක්ෂණ නියාමක III ශ්‍රේණියට පත්වීමට සුදුසුකම් ලබන නිලධාරීන්ගේ තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත්වේ.)

(ආ) පත්වීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

(ඇ) තනතුරට බඳවා ගැනීමෙන් පසු වසර තුනක් (03)ක් ඇතුළත පළමුවන කාර්යක්ෂතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය.

(ඈ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය.

(ඈ) තෝරා ගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් ව සිටිය යුතුය.

(ඉ) මෙම තනතුරු පුරප්පාඩු උතුරු පළාත සහ නැගෙනහිර පළාත තුළ පිහිටා ඇති වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල තුළ පමණක් පවතින බැවින්, මෙම තනතුරට තෝරා ගනු ලබන නිලධාරීන් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ පහත ප්‍රාදේශීය කාර්යාලවල පවතින පුරප්පාඩු සඳහා පමණක් අනුයුක්ත කරනු ලැබේ. තෝරා ගනු ලබන නිලධාරීන් අනුයුක්ත කරනු ලබන ප්‍රාදේශීය කාර්යාලය සහ අනුයුක්ත කරනු ලබන නිලධාරී සංඛ්‍යාව තීරණය කිරීම හා වෙනස් කිරීමේ අයිතිය වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

| *අනු. අංකය* | *වෙරළ සංරක්ෂණ නියාමක තනතුරු පුරප්පාඩු පවතින ප්‍රාදේශීය කාර්යාල* | *අනුයුක්ත කිරීමට බලාපොරොත්තු වන නිලධාරීන් සංඛ්‍යාව* |
|---|---|---|
| 01 | යාපනය ප්‍රාදේශීය කාර්යාලය | 03 |
| 02 | ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලය | 02 |
| 03 | අම්පාර ප්‍රාදේශීය කාර්යාලය | 02 |
| 04 | මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලය | 02 |
| අනුයුක්ත කරනු ලබන මුළු නිලධාරීන් සංඛ්‍යාව | | 09 |

**05. තනතුරු සඳහා තෝරාගනු ලබන ක්‍රමය :-**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට මෙම තනතුර සඳහා පත්වීමට අදාළ සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙලින් පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් පරිදි ලකුණු ලබාදෙනු ලැබේ.

| අනු. අංකය | ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් | 60 |
| 02 | පළපුරුද්ද | 15 |
| 03 | ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය | 20 |
| 04 | සම්මුඛ පරීක්ෂණයේදී පෙන්වන කුසලතාවය | 05 |
| එකතුව | | 100 |

**06. අයදුම් කිරීමේ ක්‍රමය**

මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍ර ආකෘතියට අනුකූලව සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන **2026.08.03** දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, තැ.පෙ.556, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතු යි. කවරයේ වම්පස උඩ කෙලවරේ "වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වෙරළ සංරක්ෂණ නියාමක III ශ්‍රේණියේ සීමිත බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු යි. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

**07. සුදුසුකම් පිළිබඳ ලියවිලි :-**

(අ) සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට සුදුසුකම් ලබන අයදුම්කරුවන් ලියවිලි වලින් සාක්ෂි ඉදිරිපත් කොට ස්වකීය යෝග්‍යතාව ඔප්පු කළ යුතු ය.

(ආ) සම්මුඛ පරීක්ෂණයේදී පහත දැක්වෙන ලියවිලිවල මුල් පිටපත් අවශ්‍ය වේ.

i. උප්පැන්න සහතිකය
ii. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික
iii. ජාතික හැඳුනුම්පත හෝ වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය
iv. මෑතකදී ලබාගත් ග්‍රාම නිලධාරී සහතිකය
v. චරිත සහතික දෙකක්
vi. වෙනත් අදාළ සහතික

**08. සාවද්‍ය තොරතුරු සැපයීම.**

අපේක්ෂකයෙකු තම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති කිසියම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව බඳවා ගැනීමට ප්‍රථම අනාවරණය වුවහොත් ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරු පිළිබඳව බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ නීති ක්‍රියාමාර්ගයන්ට යටත්ව ඔහු හෝ ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**09**. මෙම රෙගුලාසිවලින් විස්තර නොකරන ලද අදාළ වූ වෙනයම් කරුණක් වේ නම් එය වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය කරනු ඇත.

10. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදනය අතර කිසියම් අනනුකූලතාවක් පැන නැගුනහොත් එවැනි විටකදී සිංහල මාධ්‍ය නිවේදනය බලපැවැත්වේ.

මහාචාර්ය පී.බී.ටර්නි ප්‍රදීප් කුමාර,
අධ්‍යක්ෂ ජනරාල්,
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත්,
කළමනාකරණ දෙපාර්තමේන්තුව.

තැ.පෙ. 556,
නව මහ ලේකම් කාර්යාලය,
මාලිගාවත්ත,කොළඹ 10.
2026.06.23.